## ශීර්ෂය 322 - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

1. **මූල්‍ය ප්‍රකාශන**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂ සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂ සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැක. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ද මෙම වාර්තාවෙන් ඉදිරිපත් නොකෙරේ.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ)2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුයි. කෙසේ වුවද, දින 21 ක ප්‍රමාදයකින් පසුව 2019 මාර්තු 22 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වාර්ෂිකව නිකුත් කරනු ලබන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අමාත්‍යාංශ ලේකම්වරයා මාරුවීම හා අනුමැතිය ලබා ගැනීමට නොහැකි වීම මත ප්‍රමාදය සිදු වූ බව කාරුණිකව දන්වමි. |
| (ආ)අක්මුදල් සැසඳීමක් සිදු කර නොතිබුණි. | චක්‍රලේඛයේ 07(vi) ඡේදය ප්‍රකාරව අක්මුදල් සැසඳීමේ ප්‍රකාශයක් පිළියෙළ කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |

**1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ)සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර පිටපත් අනුව දෙපාර්තමේන්තුවේ ආදායම රු.836,533,974 ක් වුවද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ආදායම රු.861,958,651 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආදායමෙහි වෙනස රු.25,424,677 ක් විය. | ආදායම් නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. | උපචිත පදනම මත උද්භිද උද්‍යාන ආදායම් ශීර්ෂය සඳහා ආදායම් ගිණුම සාදා ඇති බැවින්, භාණ්ඩාගාර පරිගණක සටහන් අනුව ඇති දළ අදායමට 2017 දෙසැම්බර් 31 ආදායම 2018 ජනවාරි මස ගිණුම්ගත වීම හා 2018 දෙසැම්බර් 31 ආදායම 2019 ජනවාරි මස ගිණුම්ගත වීමද, ඊට අමතරව ආදායමින් ආපසු ගෙවීමද ගලපා 2018 වර්ෂයේ ශුද්ධ ආදායම් රැස් කිරීම ගණනය කර ඇත. |
| (ආ)මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායම් නොවන ලැබීම් යටතේ භාණ්ඩාගාර අග්‍රිම, තැන්පතු, අත්තිකාරම් හා වෙනත් ලැබීම් කිසිවක් දක්වා නොතිබුණි. | ආදායම් නොවන ලැබීම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. | අඩුපාඩුව පෙන්වාදීමෙන් පසුව සංශෝධනය කරන ලද ආකෘතියක් ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර ඇත. |
| (ඇ)ඒ.සී.ඒ. 3 ආකෘතියෙහි මුළු අග්‍රිම ලැබීම් රු.943,643,888 ක් විය යුතු වුවද එය රු.871,498,614 ක් ලෙස දක්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව අදාළ ආකෘතීන් වල ඇතුළත් වියයුතු අගයන් නිවැරදිව දැක්විය යුතු වීම. | ඒසීඒ 03 ආකෘතියේ අග්‍රිම ලැබීම් ලෙස ගෙන ඇත්තේ මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු අග්‍රිම සහ දෙපාර්තමේන්තු ආදායම් ශීර්ෂයෙන් ලද ආදායම පමණි. පෙන්වාදීමෙන් පසුව සංශෝධනය කරන ලද ආකෘතියක් ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර ඇත. |

### 1.6.3 මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය අනුව දේපල පිරියත හා උපකරණවල වටිනාකම රු.467,915,465 ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එය රු.7,557,586,399 ක් වූ බැවින් රු.7,089,670,933 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද භාණ්ඩාගාරය විසින් හිස් වත්කම් වාර්තාවක් ඉදිරිපත් කළ බැවින් වත්කම්වල නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය. | දේපළ පිරියත හා උපකරණ ශේෂයන් නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ)මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.81,704,540 ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව රු.80,069,532 ක් වූයෙන් රු.1,635,008 ක් වැඩියෙන් දක්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව අදාළ අගයන් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. | අත්තිකාරම් ලෙස දක්වා ඇත්තේ 322-11 (මුදලින් ගෙවීම්) යටතේ ශේෂය වන රු. 81,704,536 ක් වේ. |

### 1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)අග්‍රිම ලැබීම් රු.35,000,000 ක්,තැන්පතු රු.35,199,078 ක් සහ වෙනත් ආදායම් රු.20,225,429 ක් සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ලැබීම් ලෙස දක්වා නොතිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි සමාලෝචිත වර්ෂය තුළ මුදල් ගලාඒම් හා ගලායාම් නිවැරදිව දැක්විය යුතු වීම. | ඒසීඒ-සී ආකෘතියේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ලැබීම් ලෙස අග්‍රිම, තැන්පතු සහ වෙනත් ආදායම් සඳහා ශීර්ෂයන් වෙන්කර නොතිබූ බැවින් ඒවා ඇතුළත් කර නොතිබූ අතර, රජයේ විගණන අංශයෙන් පෙන්වාදී ඇති පරිදි නිවැරදිකර මේ |

| | | |
|---|---|---|
| | | සමග ඉදිරිපත් කරමි. |
| (ආ)සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවද අත්තිකාරම් ගෙවීම් රු.35,644,699 ක් පමණක් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | අත්තිකාරමේ ලැබීම් හා ගෙවීම් නිවැරදිව දැක්විය යුතු වීම. | විගණන අංශයෙන් පෙන්වාදී ඇති පරිදි නිවැරදි කර මේ සමග ඉදිරිපත් කරමි. |

## 1.6.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

-----------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ---------- | ------------------------------- |
| (අ)නිලධාරීන් 6 දෙනෙකුගෙන් අය විය යුතු රු.375,704 ක් වූ අත්තිකාරම් ණය ශේෂය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඇතැම් ණය ශේෂ ගිණුම් සාරාංශ හා මරණ පාරිතෝෂිතයෙන් අයකර ගැනීමටත් අයකරගත නොහැකි ණය ශේෂ පොතෙන් කපාහැරීමටත් කටයුතු කරමි. |
| (ආ)විශ්‍රාම ගිය නිලධාරීන් 04 දෙනෙකුට අදාළව පෞද්ගලික ලිපිගොනුවේ කටයුතු නිම නොවීම මත රු.286,551 ක ණය අයකර ගෙන නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව නිලධාරීන්ට විශ්‍රාම වැටුප් ලබා දීම සඳහා ලිපිගොනුවල කටයුතු නිම කිරීමට වග බලා ගත යුතු වීම. | 2018 දෙසැම්බර් 31 දින විශ්‍රාම ගිය නිලධාරීන් 04 දෙනෙකුගේ පෞද්ගලික ලිපි ගොනු වල කටයුතු අවසන් වූ වහාම ඉතිරි රු.286,551 අය කර ගැනිමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 1.6.6 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

--------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | --------------------- |
| (අ)දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකසා ඇති |

| | | |
|---|---|---|
| ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | යුතු වීම. | අතර, කලින් කළ අභ්‍යන්තර පාලන පද්ධතියේ දුර්වලතා හඳුනාගෙන වාර්තා කිරීමටත්, කළ යුතු වැඩිදියුණු කිරීම් නිර්දේශ කිරීමටත් අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර ඇත. 2018 වර්ෂයේදී හඳුනාගත් අභ්‍යන්තර පාලනයේ ගැටළු ඇති තැන් නිරාකරණය කිරීම සඳහා දෙපාර්තමේන්තු අභ්‍යන්තර චක්‍රලේඛ 03 ක් ද නිකුත් කර ඇතිබව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ)වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 1.6 ඡේදවල සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | දෙපාර්තමේන්තුවේ සිටි ප්‍රධාන ගණකාධිකාරී 2018 දෙසැම්බර් මස 04 දින විශ්‍රාම යාම හා නව ප්‍රධාන ගණකාධිකාරී 2019 පෙබරවාරි මස සේවයට වාර්තා කිරීමද අප දෙපාර්තමේන්තුව අයත්ව තිබූ අමාත්‍යාංශය වෙනත් අමාත්‍යාංශයක් හා ඒකාබද්ධ කිරීමද හේතුවෙන් පෙබරවාරි 28 දිනට පෙර වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට නොහැකිවූ බව කාරුණිකව දන්වා සිටිමි. |

### 1.6.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| (i) | මුදල් රෙගුලාසි 571 | 3,943,168 | වර්ෂ 2 ක් ඉක්මවූ තැන්පත් 09 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය කටයුතු කළ යුතු වීම. | පොදු තැන්පත් ගිණුමෙන් වසර 02 ඉක්මවූ පොදු තැන්පත් 25 න් 17 ක් මේ වනවිට නිරවුල් කර ඇත. |
| (ii) | මුදල් රෙගුලාසි 643 | 1,091,475 | කාලානුරූප නොවන ආකෘති පත්‍ර සම්බන්ධයෙන් භාණ්ඩාගාරයෙන් විමසා සුදුසු පියවර ගත යුතුයි. එසේ වුවද සීතාවක උද්භිද උද්‍යානයේ විදේශ සංචාරක, ළමා හා ශිෂ්‍ය කාණ්ඩයට අයත් ප්‍රවේශ පත්‍ර 1488 ක තොගයක් සුදුසු පියවරයන් නොගෙන ගබඩාවේ තැන්පත් කර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය කටයුතු කළ යුතු වීම. | මිල ගණන් සංශෝධනය වූ ප්‍රවේශපත්‍ර පොත් අපහරණය කිරීම සඳහා කමිටුවක් පත් කර කටයුතු සිදු කරමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 වියදම් කළමනාකරණය

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වැය විෂයයන් 03 කට අදාළ රු.මිලියන 23.28 ක වියදම් උද්භිද උද්‍යාන භාර අරමුදල මඟින් දරා තිබීම හේතුවෙන් එම වැය විෂයයන්හි වියදම, ප්‍රතිපාදනය ඉක්මවා නොතිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2019 වර්ෂයේදී ගෙවා තිබූ රු.3,917,114 ක වියදම් සම්බන්ධයෙන් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරවු කර නොතිබුණි. | බැරකම් නිවැරදිව හෙළිදරව් කළ යුතු වීම. | මූල්‍ය ප්‍රකාශනවල සටහන (III) මගින් ඉදිරිපත් කර ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මිරිජ්ජවිල උද්භිද උද්‍යානයේ 2006 වර්ෂයේ සිට නරඹන්නන්ගේ ආශ්වාදය සහ අධ්‍යයනික කටයුතු සඳහා කාන්තාර ආකෘති ව්‍යුහයක් නිර්මාණය කිරීමට සැලැසුම් කර ඇතත්, මේ වනවිට ඒ සඳහා වසර 12 ක පමණ කාලයක් ගත වී තිබුණද, එය සම්පූර්ණ කර නොතිබූ අතර, ඉදි ශාකය පමණක් එම භූමිය තුළ සිටුවා තිබුණි. | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු කිරීම සඳහා කටයුතු කළ යුතු වීම. | කාන්තාර ආකෘතියට අවශ්‍ය විශාල මුහුදු වැලි ප්‍රමාණය වෙරළෙන් ලබා ගැනීමට වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව අවසර නොදේ.මෙම කාන්තාර ආකෘතිය දැනට කාන්තාර ශාක එකතුවක් ලෙස සැලසුම් කර, ඒ සඳහා පතොක් වැනි ශාක එකතුවක් ද රැස්කර ඇති අතර, එහිදී අවශ්‍ය වන මුහුදු වැලි ප්‍රමාණය පෙරට වඩා බෙහෙවින් අඩුවේ.මේ සඳහා අවශ්‍ය වන මුහුදු වැලි මේ වන විට මිලදී ගෙන ඇති අතර 2019 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කරනු ලැබේ. |

**3.2 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)සීතාවක උද්භිද උද්‍යානයේ ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන.4.99 ක් වූ චේන් ලින්ක් වැටක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව කොටස් දෙකට බෙදා වෙන වෙනම ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණි.තවද කොන්ත්‍රාත්වලට අදාළ ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගැයීම් කමිටුවලින් රහස්‍ය ප්‍රකාශ ලබාගෙන නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4 (ඇ) හා 2.12 මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු විම. | ඉදිකිරීම ආරම්භ කිරීමට යන අවස්ථාවේදි මායිම පිළිබද ගැටළුවක් ඇතිවූ බැවින් රණවිරු උයන අසල කොටසට වෙන් වූ චේන්ලින්ක් වැටත්, තේ වත්ත කොටසට වෙන්වූ චේන් ලින්ක් වැටත් එකම ස්ථානයේ ඉදිකරන ලදී. 2018 වර්ෂයේදි නියමිත ආකෘති පත්‍රයේ ඇගයීම් කමිටුවල ප්‍රකාශ ලබාගෙන නොමැති අතර, |

| | | |
|---|---|---|
| | | 2019 වසරේ ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. |
| (ආ)මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානයේ 2018 වර්ෂය වෙනුවෙන් සාමාන්‍ය මිල ගණන් කැඳවීමේ පටිපාටිය අනුගමනය නොකර අවස්ථා 30 කදි රු.965,769 ක හදිසි මිලදී ගැනීම් සිදු කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසුකරුවන් තෝරා ගැනිම සිදු කළ යුතු වීම. | මෙම උද්භිද උද්‍යානය අක්කර 300 ක විශාලත්වයකින් යුතු නව උද්භිද උද්‍යානයක් වන බැවින් වාර්ෂික සැලැස්මෙන් පරිබාහිර හදිසි වියදම් කිරීමට සිදුවේ. එම අවස්ථාවලදී අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පූර්ව අනුමැතිය ඇතිව අත්‍යවශ්‍ය මිලදී ගැනීම් හා ඉදිකිරීම් කර ඇත. |

**3.3 පාඩු හා හානි**

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)සීතාවක උද්භිද උද්‍යානයේ නැරඹුම් මැදිරිය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව විගණන දිනය වන විට ඉදි කිරීම් නිම වී වර්ෂ 03 ක් ගත වී ඇතත් ගුණාත්මක මට්ටමේ දැව භාවිතයට නොගැනීම හේතුවෙන් කුඹුක් දැව විශාල ප්‍රමාණයක් පළුදුවී දිරාපත්ව තිබුණි. මේ හේතුවෙන් ගෙවන ලද රු.මිලියන1.34 ක ගෙවීම සම්බන්ධයෙන් විගණනයට සෑහීමකට පත්විය නොහැකි විය. | ඇස්තමේන්තු ප්‍රකාරව කාර්යයන් නිසි පරිදි ඉටු කර ඇති බවට තාක්ෂණික නිලධාරියා නිසි පරිදි අධීක්ෂණය සිදු කර සහතික කළ යුතු වීම. | රාජ්‍ය දැව සංස්ථාව විසින් දැව ලබා ගත් අතර දැව තට්ටුව සවිකිරීමට පෙර දැවවල මතුපිට දර්ශනයෙන් පමණක් තත්වය පරීක්ෂා කර බලා අනුමැතිය සිවිල් ඉංජිනේරු මහතා විසින් ලබාදී ඇත. යථා කාලයේදී මෙම අඩුපාඩුව මඟ හරවා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ)අවිස්සාවේල්ල උද්භිද උද්‍යානයේ රණවිරු උයන අසල "චේන්ලින්ක්" වැටක් ඉදිකිරීමට අදාළව මැණුම්පත් හා අවසාන බිල්පතේ අයිතම අංක 03 හි ඉටු කරන ලද ප්‍රමාණය දික් අඩි (Lft) 1200 ක් සඳහා ගෙවීම් කර තිබුණි. එසේ වුවද භෞතික පරීක්ෂාවේදි දික් අඩි (Lft) 1,120.75 ක ප්‍රමාණයක් පමණක් ඉදිකර තිබීම හේතුවෙන් ඉටු නොකරන ලද දික් අඩි 79.25 (Lft) ක් වෙනුවෙන් | ගෙවීම් කිරීමට පෙර අදාළ කාර්යයන් නිසි පරිදි ඉටු කර ඇති බවට තාක්ෂණික නිලධාරියා අධීක්ෂණය සිදු කළ යුතු වීම. | සිවිල් ඉංජිනේරු විසින් මිනුම් ගත කරන අවස්ථාවේදි දික් අඩි 1200ක් බව තහවුරු වූ බැවින් දික් අඩි 1200 කට ගෙවීම් කර ඇත. විගණන විමසුමෙන් පසුවද සිවිල් ඉංජිනේරු මහතා විසින් නැවත මැන බිල්පතින් ගෙවා ඇති ප්‍රමාණය නිවැරදි බව තහවුරු කරන ලදී. |

රු. 101,836 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානයට අදාළ ඉඩමෙහි අක්කර ½ ක පමණ කුඹුරු ඉඩම අනවසර පදිංචිකරුවෙකු විසින් භුක්ති විඳින අතර, මෙම ඉඩම අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් නිරවුල් කර ආරක්ෂාව තහවුරු කර ගත යුතු වීම. | අනවසර පදිංචිකරු සම්බන්ධයෙන් මේ වන විටත් හංවැල්ල ප්‍රාදේශීය ලේකම් හරහා නීති ප්‍රකාරව කටයුතු කරගෙන යන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ)හක්ගල උද්භිද උද්‍යානයට රු.7,730,690 ක පිරිවැයක් දරා 2016 වර්ෂයේදී ඉදිකරන ලද පතුරු සහිත (Louvers) ජනෙල් හා දොර යෙදූ නිල නිවස ශීත දේශගුණික තත්ත්වයකට උචිත ලෙස ඉදිකර නොතිබුණු බැවින් එම ඉදි කිරීම් නිමකරන ලද දිනයේ සිටම භාවිතයට ගෙන නොතිබුණි. | අධ්‍යයනයකින් සහ නිසි සැලකිල්ලෙන් සැලැසුම් කිරීම සිදු කළයුතු අතර, වත්කම් උපරිමව භාවිතා කළ යුතු වීම. | දිවා කාලයේදී සැලකිය යුතු උෂ්ණත්වයක් පවතින දේශගුණික කාලයක්ද මෙම ප්‍රදේශයට පවතින බැවින් මේ ආකාරයට පතුරු සහිත ජනේල් (Louvers) පැවතීම අවශ්‍ය අංගයක් බව ඉංජිනේරු නිර්දේශයයි. එසේම අවශ්‍ය අවස්ථාවන්හිදී මෙම පතුරු සහිත ජනේල්(Louvers) වීදුරු වැනි ආවරණයක් යොදා ආවරණය කිරීමේ හැකියාවක් පවතින බැවින් විශාල ගැටළුවක් ඇති නොවන බව කාරුණිකව පෙන්වා දෙමි. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයට අයත් පැළ විකුණුම් මධ්‍යස්ථානයේ ඇති මුදල් අයකැමි | එක් එක් පැළ සඳහා වෙන් වෙන්ව අංක ඇතුළත් කළ යුතු වීම. | දැනට රාජකීය උද්භිද උද්‍යානයේ භාවිතා කරන මුදල් අයකැමි යන්ත්‍රය උද්‍යානයේ විකුණන සියලුම පැළ වර්ග |

| | | |
|---|---|---|
| යන්ත්‍රයෙන් ඖෂධ පැළ වර්ග 145 ක් හා අනෙකුත් විසිතුරු පැළ වර්ග 17 කට අධික ප්‍රමාණයක් සඳහා නිවැරදි කේත අංක කර නොතිබුණි.එම හේතුවෙන් එම පැළවලට සමාන මිල ගණන් ඇති වෙනත් පැළවල කේත අංක යටතේ පාරිභෝගිකයන්ට නිකුත් කර රිසිට් පත් ලබා දෙන බැවින් විකිණෙන පැළ ප්‍රමාණයන් නිවැරදිව ගණනය කිරීමට අපහසු විය. | | ඇතුළත් කිරීමට තරම් ප්‍රමාණවත් ධාරිතාවකින් යුක්ත නොවේ. වැඩි පහසුකම් සහිත යන්ත්‍රයක් ඉක්මනින් මිලදී ගැනීමෙන් පසු ඉහත ගැටළු මග හරවා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ)සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ජූනි දක්වා පැළ අළෙවි සැල වෙත එවන ලද පැළවලින් රු.126,520 ක් වටිනා පැළ 3,355 ක් විනාශ වී තිබූ අතර ඒවා පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | විධිමත්ව පැළ අපහරණය කිරීමට කටයුතු කළ යුතු වීම. | ලැයිස්තුවේ සඳහන් විනාශ වී ඇති පැළ පොතෙන් ඉවත් කිරීම සඳහා කමිටුවක් පත් කිරීමට කටයුතු කරමින් පවතින අතර එම කටයුතු නිම වූ වහාම විනාශ වන පැළ විධිමත්ව පොතෙන් ඉවත් කිරීමට කටයුතු කරන බවද දන්වා සිටිමි. |
| (ඇ)හක්ගල උද්භිද උද්‍යානය නැරඹීම සඳහා පැමිණෙන විදේශ සංචාරකයන් සඳහා විදේශීය වැඩිහිටි, ටිකට් පත් 300,000 ක් පමණ නිකුත් කර තිබුණද මෙම ප්‍රවේශ පත්‍ර වර්ෂ 10 කට පමණ ප්‍රමාණවත් වන බව නිරීක්ෂණය විය. කාලයෙන් කාලයට ගාස්තු සංශෝධනය වන හෙයින් මෙසේ ප්‍රවේශ පත්‍ර විශාල ප්‍රමාණයක් මුද්‍රණය කිරීම ප්‍රායෝගික කටයුත්තක් නොවුණි. තවද ප්‍රවේශ පත්‍රවල අවශ්‍යතාවය පිළිබඳ ඉල්ලීමක් නොමැතිව පේරාදෙණිය උද්භිද උද්‍යානයට ප්‍රවේශ පත්‍ර යැවීමට කටයුතු කර තිබුණි. | දෛනිකව අලෙවි වන ප්‍රවේශ පත්‍ර ප්‍රමාණය සැලකිල්ලට ගෙන උද්‍යාන වෙත ලබා දීමට කටයුතු කළ යුතු වීම. | හක්ගල උද්‍යානය නැරඹීම සඳහා වාර්ෂිකව පැමිණෙන විදේශීය වැඩිහිටිසංචාරකයින්ගේ ප්‍රමාණය ගැන සැලකිල්ලට ගෙන ඉදිරි වර්ෂය සඳහා අවශ්‍ය වන විදේශීය වැඩිහිටි ප්‍රවේශ පත්‍ර ප්‍රමාණය සඳහා ප්‍රවේශ පත්‍ර 50000 ක් තබාගෙන ඉතිරි ප්‍රවේශ පත්‍ර 250000 ක ප්‍රමාණය පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ අලෙවි කිරීම සඳහා ලබාදීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඈ)නාරාහේන්පිට (කොළඹ) සහකාර අධ්‍යක්ෂ කාර්යාලයට අයත් 56-5389 දරන කැබ් රථය 2015 ඔක්තෝබර් 17 දින රියදුරාගේ අපරික්ෂාකාරී රිය ධාවනය හේතුවෙන් අනතුරට පත්ව තිබුණි.ඒ අනුව මු.රෙ.104 (04) වාර්තාව ප්‍රකාරව අලාභය 151,700 ක් බවත් එයින් සියයට 10 ක් පමණක් රියදුරුගෙන් අය කර ගෙන තිබුණි.කෙසේ වුවද, වාහනයට අදළ රක්ෂණ සහතික හා ආදායම් බලපත්‍ර ලබා නොගැනීම, වාහනය පවරා නොගැනීම, රියදුරු සේවයේ කම්කරුවකු යෙදවීම සම්බන්ධයෙන් | වගකිව යුතු පුද්ගලයින්ගෙන් අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අදාළ අනතුර වන අවස්ථාවේදී රියදුරු මහතා රාජ්‍ය තාන්ත්‍රික විදේශ නිලධාරීන් සමඟ දින 02 ක දීර්ඝ ගමනකින් පසු අධික වෙහෙසට පත් වී සිටි බව නිරීක්ෂණය වී ඇති බැවින්, වාහනයට සිදු වූ අනතුරෙන් සියයට 10 ක් පමණක් අධිභාර කර ඇත. රියදුරු හිඟකම නිසා වාහන ධාවන බලපත්‍ර තිබෙන කම්කරුවකු ඔහුගේද කැමැත්ත මත මෙම රියදුරු රාජකාරිය සඳහා යොදවාගෙන ඇත. අදාළ වාහනය සඳහා ආදායම් බලපත්‍රය හා රක්ෂණ සහතිකය ලබාගෙන නොමැති අවස්ථාවක ධාවනයේ යොදා ගැනීම |

| | |
|---|---|
| වගකිව යුතු නිලධාරීන්ට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව සෑහීමකට පත් විය නොහැක. | වරදක් බව පිළිගනිමි. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මල් වගා හා පර්යේෂණ අංශයේ කටයුතු සම්බන්ධයෙන් ආයතනයේ දැක්ම, අරමුණු හා ක්‍රියාත්මක වැඩසටහන් අනුව අරමුණු 08 ක් යටතේ උප ඉලක්ක 17 ක් හඳුනාගත යුතුව තිබුණද, හඳුනාගෙන තිබුණේ අරමුණු 03 ක් හා උප ඉලක්ක 05 ක් පමණි. තවද මෙම තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ නිලධාරීන්ගේ දැනුවත්භාවයද ප්‍රමාණවත් නොවුනි. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකරගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | මල් වගා පර්යේෂණ අංශය වෙනුවෙන් හඳුනාගත් අරමුණු 08 න් අරමුණු 03 ක් යටතේ උප ඉලක්ක 05 ක් දැනටමත් හඳුනාගෙන ක්‍රියාත්මක වෙමින් පවතින අතර, ඉතිරි අරමුණුද යථා කාලයේදී ඉටු කිරීම සඳහා කටයුතු කරමි. |

**5. මානව සම්පත් කළමනාකරණය**

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | උද්‍යානවල කටයුතු විධිමත්ව හා ක්‍රමවත්ව පවත්වාගෙන යාමට සේවා අවශ්‍යතා සුදුසු අවස්ථාවේදී හඳුනා ගනිමින් අවශ්‍ය අවස්ථාවේ බඳවා ගැනීම සිදු කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 275 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවලින් 17 ක් විද්‍යාත්මක සේවයේ බඳවාගැනීම් වන අතර, ප්‍රමාදයට හේතුව නඩු කටයුත්තක් බැවින් එය නිෂ්ප්‍රභා වී ඇති බැවින් බඳවා ගැනීම් මේ වසරේ කළ හැකි බව සහ තෘතීය මට්ටමේ පුප්පාඩු උද්‍යාන සහකාරවරුන් වන අතර,මේ වනවිට ඒ සම්බන්ධ සම්මුඛ පරීක්ෂණ අවසන් කර රාජ්‍ය සේවා කොමිසමට යොමු කර ඇත. ද්විතියික මට්ටමේ |

| | | | |
|---|---|---|---|
| | | | පුරප්පාඩු විභාග දෙපාර්තමේන්තුව මගින් විභාග පවත්වා කුසළතා පදනම මත නාම ලේඛන ලබාගෙන දැනට පත්වීම් ලබාදී ඇත. ප්‍රාථමික මට්ටමේ තනතුරුවලින් 150 කට ආසන්න තනතුරු සංඛ්‍යාවක් 2018 වසරේදී බඳවා ගෙන ඇත. බැටරි කාර් ඔපරේටර් තනතුරු 19 ක් බඳවා ගැනීම සඳහා බදවා ගැනීමේ පටිපාටිය සකසා අවසන්කර ඇත. |
| (ආ) | මිරිජ්ජවිල උද්භිද උද්‍යානයේ තාක්ෂණික රාජකාරිවල නිරත සේවකයින් දෙදෙනෙකුට වර්ෂ 10කට පෙර බඳවා ගන්නා අවස්ථාවේ ලබා දුන් සති 02 අඩු මූලික පුහුණුව හැර කිසිදු පුහුණුවීමක් ලබාදී නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම හා කුසලතා වර්ධනයට අවශ්‍ය පුහුණුවීම් අවස්ථා ලබා දිය යුතු වීම. | මෙම අංශයේ නිලධාරීන් හා සේවකයින් සඳහා අවශ්‍ය පුහුණුවීම් හඳුනාගෙන ඔවුන්ට අවශ්‍ය පුහුණුවීම් ලබා දීමට කටයුතු කරමි. |